*සැ. යු.*- 2017.09.15 දින පළ වූ අංක 2,037 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,038 - 2017 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2017.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 860 |

*සැ. යු.* - විසර්ජන පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 ඔක්තෝබර් මස 13 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 සැප්තැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

**කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය මෙහෙයවන) බස්නාහිර පළාතේ වානිජ මහාධිකරණයේ දී ය**

මීරිගම පිහිටි, මීරිගම අපනයන පිරිසැකසුම් කලාපයේ අංක 28 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි ලිපිනය පිහිටා ඇති (කලින් සුසිල් වනස්පති (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ), අංක PV 4307 යටතේ ලියාපදිංචි කරන ලද හෙල්ත් ෆුඩ්ස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංක : 36/2017/CO

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

මීරිගම, පිහිටි මීරිගම අපනයන පිරිසැකසුම් කලාපයේ අංක 28 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි ලිපිනයේ පිහිටා ඇති : හෙල්ත් ෆුඩ්ස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

....................................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ වානිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, 2017 ක්වූ අගෝස්තු මස 04 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ මාලින් රාජපක්ෂ විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2017 ක්වූ ඔක්තෝබර් මස 25 වැනි දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධවීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේනම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

මාලින් රාජපක්ෂ,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 156-1/5, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

***සටහන.***- එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ මාලින් රාජපක්ෂ වෙත භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2017 ක්වූ ඔක්තෝබර් මස 24 වැනි දින සවස 6.00 ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

09-452

---

**කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය මෙහෙයවන) බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය**

කොළඹ 06, කිරුළපන, එඩ්මන්ටන් පාරේ, අංක 50 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ අංක PV 20059 යටතේ ලියාපදිංචි කර ඇති,

නඩු අංක : 31/2017/CO

වෙස්ට්‍රාන්ස් එයාර් එක්ස්ප්‍රස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම පිළිබඳ කාරණයේ දී

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

එක්පෝ ලංකා ෆ්‍රේට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සිය ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 10, මයිල් පෝස්ට් ඇවිනිවු, කොළඹ 03.

.....................................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, 2017 ක්වූ ජූලි මස 21 වන දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ මාලින් රාජපක්ෂ විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2017 ක්වූ නොවැම්බර් මස 27 වන දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

මාලින් රාජපක්ෂ,
පෙත්කසම්කරුගේ නීතිඥ,
අංක 156-1/5, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

*සටහන* .- එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ මාලින් රාජපක්ෂ වෙත භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2017 ක්වූ නොවැම්බර් මස 26 වන දින සවස 6.00 ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කල යුතු ය.

09-453

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.